# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 1508 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திக / Date – 25/09/2024 පැය 0545

**මාධ්‍ය නිවේදනය**

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.</u>**

**01. මනුෂ්‍ය ඝාතනයක් - කළුවංචිකුඩි පොලිස් වසම.**

2024.09.24 වන දින උදෑසන කාලයේ කළුවංචිකුඩි පොලිස් වසමේ කලුදාවලි 04 ප්‍රදේශයේ නිවසක් තුල කාන්තාවක් මියගොස් ඇති බවට කළුවාංචිකුඩි පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 45ක් වූ කලුදාවලි 04 ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මරණකාරිය සහ ඇගේ සැමියා අතර පෙර දින රාත්‍රියේ ආරවුලක් ඇතිවී ඇති අතර එහිදී සැමියා විසින් සිදුකල පහරදීමකින් මෙම ඝාතනය සිදුව ඇති බවට දැනට සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය මඩකලපුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. සිද්ධියෙන් පසු සැකකාර සැමියා ප්‍රදේශයෙන් පලාගොස් ඇති අතර අත්අඩංගුවට ගැනීම සඳහා කළුවංචිකුඩි පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. විදුලිසැර වැදී පුද්ගලයෙකු මියයාම - කොබෙයිගනේ පොලිස් වසම.**

2024.09.24 වන දින උදෑසන කාලයේ කොබෙයිගනේ පොලිස් වසමේ තිඹිරපොකුණ ප්‍රදේශයේ පුද්ගලයෙකු කඩකාමරයක් තුල විදුලිසැර වැදී මියගොස් ඇති බවට කොබෙයිගනේ පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 42ක් වූ බොරළුවැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මහේස්ත්‍රාත් පරීක්ෂණය සිදුකර පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා කුලියාපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර කොබෙයිගනේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. දියේ ගිලී අතුරුදහන්වීමක් - මාතලේ පොලිස් වසම.

2024.09.24 වන දින සවස් කාලයේ මාතලේ පොලිස් වසමේ ඕවල පොල්වත්ත බලාගාරය අසල සුදු ගඟේ දියනෑමට ගිය තරුණයෙකු දියේගිලී අතුරුදහන් බවට මාතලේ පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

**අතුරුදහන් අය වයස අවුරුදු 21ක් වන දුම්කොලවත්ත, මාතලේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අතුරුදහන් වූ පුද්ගලයා සොයා මාතලේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරගෙන යනු ලබයි.

## 04. සැකකටයුතු මරණයක් - ආරච්චිකට්ටුව පොලිස් වසම.

2024.09.24 වන දින සවස් කාලයේ ආරච්චිකට්ටුව පොලිස් වසමේ විජයකටුපොත ප්‍රදේශයේ නිවසක් ඉදිරිපිට පුද්ගලයෙකු තුවාල සහිතව ගල් ගොඩක් උඩ වැටී සිටින බවට ලද පණිවිඩයක් මත ආරච්චිකට්ටුව පොලිසිය විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු අවුරුදු 57 ක්වූ අංක විජයකටුපොත, හලාවත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මහේස්ත්‍රාත් පරීක්ෂණය සඳහා මෘත ශරීරය සිද්ධිය වූ ස්ථානයේ පොලිස් ආරක්ෂාව යටතේ ඇත. ආරච්චිකට්ටුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 05. හෙරොයින් සමඟ සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන අංශය.

2024.09.24 වන දින රාත්‍රී කාලයේදී, ගල්කිස්ස පොලිස් වසමේ බඩෝවිට හා ඕඩියන් ප්‍රදේශ වලදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත වැටලීම් 03ක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 150 ක්, හෙරොයින් ග්‍රෑම් 06 මිලිග්‍රෑම් 200 ක් හා හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 200 සමඟ සැකකරුවන් තිදෙනෙකු** අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 17, 36 හා 49 යන වයස්වල පසුවන ගල්කිස්ස සහ දෙහිවල ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. හෙරොයින් හා අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.

2024.09.24 වන දින ගල්කිස්ස පොලිස් වසමේ රස්ටම්වත්ත හා බොරුපන ප්‍රදේශවලදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද

තොරතුරු මත වැටලීම් 02ක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 500 ක් හා අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 ක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 36 හා 52 යන වයස්වල පසුවන රත්මලාන ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.

2024.09.24 වන දින දහවල් කාලයේදී, බොරැල්ල පොලිස් වසමේ සරණපාල හිමි මාවත ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 950 සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 49ක් වන බොරැල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 08. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - යක්කල පොලිස් ස්ථානය.

2024.09.24 වන දින සවස් කාලයේදී, යක්කල පොලිස් වසමේ 14 හන්දිය ප්‍රදේශයේදී යක්කල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 350ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 24 ක් වන ඉබුල්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

යක්කල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 09. නීතිවිරෝධී මත්පැන් සමග සැකකරුවෙකු අත්අඩංගුවට - මීගමුව පොලිස් ස්ථානය.

2024.09.24 වන දින රාත්‍රී කාලයේ මීගමුව පොලිස් වසමේ දළුපත ප්‍රදේශයේදී මීගමුව පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර නීතිවිරෝධී මත්පැන් ලීටර් 57 (බෝතල් 77) ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 64 ක් වන දළුපත, මීගමුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මීගමුව පොලීසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 10. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් හා ගෝඩා සමග සැකකරුවෙකු අත්අඩංගුවට - ඇතිමලේ පොලිස් ස්ථානය.

2024.09.24 වන දින දහවල් කාලයේ ඇතිමලේ පොලිස් වසමේ නවගම්මානය ප්‍රදේශයේදී ඇතිමලේ පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් හා නීතිවිරෝධී මත්පැන්

පෙරීමට ගන්නා ගෝඩා ලීටර් 190ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 48 ක් වන මයුරාගම, ඇතිමලේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ඇතිමලේ පොලීසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**11. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - නාඋල පොලිස් ස්ථානය.**

2024.09.24 වන දින දහවල් කාලයේ නාඋල පොලිස් වසමේ ලිහිණිපිටිය ප්‍රදේශයේදී නාඋල පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 63 ක් වන මඩවලඋල්පත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

නාඋල පොලීසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**12. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - සෙවනගල පොලිස් ස්ථානය.**

2024.09.24 වන දින සවස් කාලයේ සෙවනගල පොලිස් වසමේ නුගේගලයාය ප්‍රදේශයේදී සෙවනගල පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 70 ක් වන කිරිවැව, සෙවනගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සෙවනගල පොලීසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**13. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - වාලච්චේන පොලිස් ස්ථානය.**

2024.09.24 වන දින සවස් කාලයේ වාලච්චේන පොලිස් වසමේ මිනිමිනිත්තවේලි ප්‍රදේශයේදී වාලච්චේන පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 24 ක් වන කිරාන් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වාලච්චේන පොලීසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**14. මාරක රිය අනතුරක් - කාත්තන්කුඩි පොලිස් වසම.**

2024.09.24 වන දින සවස් කාලයේ කාත්තන්කුඩි පොලිස් වසමේ මඩකලපුව කල්මුණ මාර්ගයේ කල්ලඩි ප්‍රදේශයේදී කල්මුණ දෙස සිටමඩකලපුව දෙසට ධාවනය වූ ලොරි රථයක් එම දිශාවටම ගමන්කල යතුරුපැදියක් පසුකර යාමේදී

ලොරි රථයේ බඳ කොටසේ යතුරු පැදිය ගැටීමෙන් පැදිකරුට පාලනය කර ගත නොහැකිව මාර්ගයේ පෙරළී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරු පැදියේ පසු පැදිකාරිය බරපතල තුවාල ලබා මඩකලපුව රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 48 ක් වූ කාත්තන්කුඩි 06 ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය මඩකලපුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර, අනතුරට සම්බන්ධ ලොරි රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත.කාත්තන්කුඩි පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**